(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 236.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 ජනවාරි මස 24 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියසේන ගමගේ මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **පියංකර ජයරත්න මහතා**

ගරු **(වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**

ගරු **මයිල්වාගනම් තිලකරාජා මහතා**

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා**

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**

ගරු **අනුර දිසානායක මහතා**

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**

**ගරු බුද්ධික පතිරණ මහතා**

**ගරු කේ. කේ. පියදාස මහතා**

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**

**ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා**

**ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා**

**ගරු ඉම්රාන් මහරුෆ් මහතා**

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**

**ගරු ප්‍රසන්න රණවීර මහතා**

**ගරු ඉෂාක් රහුමාන් මහතා**

**ගරු ගාමිණී ලොකුගේ මහතා**

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු ඩුලිප් විජේසේකර මහතා**

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) කථානායකතුමා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

(i) 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XV හා XVI කොටස්;

(ii) 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV හා XXV කොටස්, පස්වැනි කාණ්ඩයේ I කොටස සහ හයවැනි කාණ්ඩයේ XIII හා XIV කොටස්; සහ

(iii) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV හා V කොටස් පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයිද මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්—

(i) 2015 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්—

(i) 2015 වර්ෂය සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2015 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැව්ලි සමාගමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. පෙත්සම් :**

(i) තිස්සමහාරාම, ලූකස්ගොඩ, අංක 197 දරන ස්ථානයෙහි පදිංචි ඒ. කේ. පී. මහින්ද මහතාගෙන් ලැබුණු 2017.11.13 දිනැති පෙත්සම;

(ii) මාතර, නාවිමන දකුණ, හුංගන්ගොඩ, "සමනල පියස" යන ලිපිනයෙහි පදිංචි ආදිත්‍ය බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2017.11.06 දිනැති පෙත්සම;

(iii) මාතර, කොටුව, බරවා රෝග මර්ධන ඒකකයේ සේවය කරන ඩී. එච්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2017.09.27 දිනැති පෙත්සම;

(iv) හක්මණ, දෙනගම, දෙනගම බටහිර, "චතුර" යන ලිපිනයෙහි පදිංචි ජේ. ජී. ගුණපාල මහතාගෙන් ලැබුණු 2017.11.14 දිනැති පෙත්සම;

(v) ගාල්ල, මාම්පිටිය, ජය මාවත යන ලිපිනයෙහි පදිංචි කේ. එම්. ජී. ටී. ආර්. වෛද්‍යාරත්න මහතාගෙන් ලැබුණු 2017.10.02 දිනැති පෙත්සම;

(vi) දික්වැල්ල, සැන්ඩ්ස් පාර යන ලිපිනයෙහි පදිංචි එම්. එම්. එම්. ඉන්සාෆ් මහතාගෙන් ලැබුණු 2017.11.25 දිනැති පෙත්සම;

(vii) පිටබැද්දර, තැන්නහේන, "ලහිරු" යන ලිපිනයෙහි පදිංචි පී. වී. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2017.11.14 දිනැති පෙත්සම;

(viii) ඉබ්බාගමුව, බක්මීගොල්ල, අංක 413/2 දරන ස්ථානයෙහි පදිංචි පී. ජේ. දිසානායක මහතාගෙන් ලැබුණු 2017.10.19 දිනැති පෙත්සම;

(ix) වැලිගම, සමරවීර පාර, අංක 5/8 දරන ස්ථානයෙහි පදිංචි පද්මිනී නන්දසිරි මහත්මියගෙන් ලැබුණු 2017.11.15 දිනැති පෙත්සම;

(x) පාදුක්ක, වේරගල, ඩේල් එස්ටේට්, අංක 142/ 7/ 43 ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්. පී. අමරදාස මහතාගෙන් ලැබුණු 2017.11.14 දිනැති පෙත්සම;

(xi) දෙනියාය, බටාදුර, අංක 49 දරන ස්ථානයෙහි පදිංචි සරත් වීරවර්ධන දිසානායක මහතාගෙන් ලැබුණු 2017.10.23 දිනැති පෙත්සම;

(xii) අකුරැස්ස, මාරඹ, ගල්හේන, පාසල පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. වී. දිමුතු සමීර මහතාගෙන් ලැබුණු 2017.10.19 දිනැති පෙත්සම; සහ

(xiii) මාතර, දැල්කඩ පාර, අංක 45/1 දරන ස්ථානයෙහි පදිංචි වයි. බී. මාග්‍රට් මහත්මියගෙන් ලැබුණු 2017.11.14 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන් වුවද, 2018 පෙබරවාරි 19 වැනි සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු අතර එදින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.00 සිට අ. භා. 12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2018 පෙබරවාරි මස 19 වැනි සඳුදා පූ. භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

(අ. භා. 2.34 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු එස්. ශ්‍රීතරන් මහතා,ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා ස්ථිර කරමින් යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.46 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

4 වැනි වගන්තිය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 7 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ධීවර බෝට්ටුවක් හෝ වෙනත් දෙයක් හෝ අත්හැර දමන ලද";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 2 වැනි පිටුවේ 30 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"21 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මහේස්ත්‍රාත්වරයා විසින් සුදුසු යැයි සලකනු ලබන";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 3 වැනි පිටුවේ 18 වැනි සහ 19 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"බෝට්ටුවක් තහනමට ගෙන රඳවා ගත් අවස්ථාවක දී; සහ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 3 වැනි පිටුවේ 21 වැනි සහ 22 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"නෞකාධිපතිට, අයිතිකරුට, එය කුලියට ගත් තැනැත්තකු හෝ ඒ බෝට්ටුවේ ගමන් කරනු ලබන යම් තැනැත්තකු ඇත්නම් ඔහුට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 3 වැනි පිටුවේ 30 වැනි සහ 31 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(2) බෝට්ටුව තහනමට ගෙන රඳවා ඇත්තේ නැතහොත් නඩු කටයුත්ත පවරනු";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 3 වැනි සහ 4 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"විදේශීය ධීවර බෝට්ටුවක් තහනමට ගෙන රඳවා ගනු ලැබූ අවස්ථාවක දී, එම විදේශීය ධීවර";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ගත් තැනැත්තකු හෝ අවසරපත්‍ර දරන්නකු ඇත්නම් ඔහු විසින් ඒ විදේශීය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 4 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තකු මේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 4 වැනි පිටුවේ 30 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය:

එසේ වුව ද, එම නෞකාධිපති, අයිතිකරු සහ එය කුලියට ගත් තැනැත්තා හෝ ඒ බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ පළමුවරට වරදක් සිදු කරනු ලබන විට එම එක් එක් තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේදී අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන එක් අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ මෙහි I වැනි උපලේඛනයේ I වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ධීවර

බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව මෙහි I වැනි උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තකු මේ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"මුදලට නොඅඩු දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය:

එසේ වුවද, එම නොකාධිපති, අයිතිකරු සහ එය කුලියට ගත් තැනැත්තා හෝ ඒ බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ පළමුවරට වරදක් සිදු කරනු ලබන විට එම එක් එක් තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන එක් අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ මෙහි II වැනි උපලේඛනයේ I වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව මෙහි II වැනි උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ඔහු හෝ ඒ බෝට්ටුවේ ගමන් ගන්නා හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තකු";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 5 වැනි පිටුවේ 32 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ඔහු හෝ ඒ බෝට්ටුවේ ගමන් ගන්නා හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තකු";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 7 වැනි සහ 8 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"යටතේ වරදක් සිදු කිරීම සඳහා සූදානම් වන්නා වූ හෝ ආධාර වන්නා වූ යම් ක්‍රියාවක් සිදු කරනු ලබන යම්";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"වගන්තිය යටතේ වරදකට සැක කරනු ලැබූ හෝ";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 6 වැනි පිටුවේ 24 වැනි සහ 25 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"ඇතුළත් විධිවිධානවලට යටත්ව 15, 15අ සහ 15ඇ වගන්ති යටතේ යම් වරදක් සිදු කිරීමේ දී";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 7 වැනි පිටුවේ 2 වැනි සහ 3 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"අයිතිකරුවෙකු, එය කුලියට ගත් තැනැත්තකු, බෝට්ටුවේ ගමන් ගන්නා හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තකු ඔහුගේ":

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වැනි වගන්තිය සහ 8 වැනි වගන්තිය සභා සම්මත විය.

9 වැනි වගන්තිය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 8 වැනි පිටුවේ 4 වැනි පේළියේ සිට 10 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"9. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වැනි වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ සහ 17ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

සියලු වැරදි සංඥෙය හා ඇප ලබාදිය නොහැකි වැරදි විය යුතු බව.

17අ. මේ පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ සිදු කරන ලද සියලු වැරදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය සහ ඇප ලබාදිය නොහැකි වැරදි විය යුතු ය.

(22 වැනි අධිකාරය වූ) අපරාධ වැළැක්වීමේ ආඥාපනත අදාළ කර ගැනීම.

17ආ. (22 වැනි අධිකාරය වූ) අපරාධ වැළැක්වීමේ ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ පෙර වරදක් සිදු කරන ලද තැනැත්තකු හඳුනා ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තියේ සිට 12 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

13 වැනි වගන්තිය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 10 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එම වරද සමථයකට පත් කිරීම සුදුසු වේ නම්, ඒ තැනැත්තා";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 10 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"සීමාවක් ඇතුළත පෙනී සිට තමාගෙන් යම් මුදල් අයකිරීමක් සිදු";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 11 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 9 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"පනත යටතේ පනවනු ලැබිය හැකි අවම දණ්ඩනයෙන් පහෙන් එකකට නොඅඩු මුදලක් ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු ය. තව ද, බෝට්ටුවේ, එහි ඇති මසුන්ගේ හෝ වෙනත් දෙයෙහි ඇස්තමේන්තු කළ වටිනාකමෙහි ද ඒ බෝට්ටුව රඳවා තැබීම සහ එහි සේවක පිරිස පෙරළා සිය රට යැවීම සම්බන්ධයෙන් දරන ලද වියදම්වල ද එකතුව නොඉක්මවනු ලබන මුදලක්, මේ වගන්තිය යටතේ වරද සමථයට පත් කිරීමේ කොටසක් වශයෙන් ගෙවිය යුතු අතර මහේස්ත්‍රාත්වරයා විසින් රඳවාගැනීමේ ආඥාවක් ලබා දී නොමැති අවස්ථාවක දී එම ධීවර බෝට්ටුව, මසුන් හෝ වෙනත් දේ මුදා හැරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියෝගයක් ලබා දිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 11 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"එකක කාලයක් ඇතුළත එම වරද සමථයට පත් කිරීමට";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 11 වැනි පිටුවේ 22 සහ 23 වැනි පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"නිශ්චිතව සඳහන් කර ඇති මුදල එම තැනැත්තාගෙන් අය කරගනු ලැබිය හැකිය.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ තවත් සංශෝධනයක් : 11 වැනි පිටුවේ 24 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"(5) මේ වගන්තියේ (2) වැනි උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති මුදල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් තැනැත්තකුගෙන් අයකරනු ලබන අවස්ථාවක දී, එම අයකිරීම පිළිබඳ තොරතුරු";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තියේ සිට 20 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

21 වැනි වගන්තිය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 17 වැනි පිටුවේ 14 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

'නොමැති බෝට්ටුවක් ඇතුළත් වේ;

" බලයලත් නිලධාරී"යන්නෙන් ධීවර පනත යටතේ පත් කරනු ලැබූ ධීවර පරීක්ෂකවරයකුගේ පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ යම් නිලධරයෙක් හෝ නාවික හමුදාවේ සුළු නිලධරයකුගේ පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ සමාජිකයෙක්, ගුවන් හමුදාවේ සාජන්ට්වරයෙකු පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ සමාජික, සාජන්ට් පදවියට අඩු නොවන පදවියක් දරන්නා වූ යම් පොලිස් නිලධරයෙක්, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිත්‍ය සේවයට අනුයුක්ත යම් තැනැත්තකු සහ අමාත්‍යවරයා විසින් ලිඛිතව නමින් හෝ ධුරයෙන් එසේ නම් කරනු ලැබූ යම් වෙනත් තැනැත්තකු අදහස් වේ;";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තිය සභා සම්මත විය.

පළමුවැනි උපලේඛනය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 21 වැනි පිටුවේ සඳහන් පළමුවැනි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමට,—

**I වැනි උපලේඛනය**

(15 වැනි වගන්තිය)

| **I වැනි තීරය** | **II වැනි තීරය** |
|---|---|
| **බෝට්ටුවේ දිග මීටර්වලින්** | **දඩය (රු. මිලියන)** |
| | **දේශීය ජල තීරය** |
| 15 ට අඩු | 6 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 20 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 100 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 150 |
| 75 ට වැඩි | 175 |
| පරිපාලන දඩය | අදාළ නොවේ |

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"පළමුවැනි උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

දෙවැනි උපලේඛනය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 21 වැනි පිටුවේ සඳහන් දෙවැනි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමට,—

**II වැනි උපලේඛනය**

(15අ වැනි වගන්තිය)

| **I වැනි තීරය** | **II වැනි තීරය** |
|---|---|
| **බෝට්ටුවේ දිග මීටර්වලින්** | **දඩය (රු. මිලියන)** |
| | **දේශීය ජල තීරය තුළ** |
| 15 ට අඩු | 4 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 15 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 75 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 120 |
| 75 ට වැඩි | 150 |
| පරිපාලන දඩය | අදාළ නොවේ |

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“දෙවැනි උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තෙවැනි උපලේඛනය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 22 වැනි පිටුවේ සඳහන් තෙවැනි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමට,—

**III වැනි උපලේඛනය**

(15 වැනි වගන්තිය)

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| බෝට්ටුවේ දිග මීටර්වලින් | ගාස්තුව (රු. මිලියන) |
| | අනන්‍ය ආර්ථික කලාපය තුළ |
| 15 ට අඩු | 10 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 30 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 120 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 180 |
| 75 ට වැඩි | 220 |
| පරිපාලන ගාස්තුව | මුල් ගාස්තුවෙන් 1/5 |

“සංශෝධනය පිළිගත යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“තෙවැනි උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

හතරවැනි උපලේඛනය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 22 වැනි පිටුවේ සඳහන් හතරවැනි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමට,—

**IV වැනි උපලේඛනය**

(15ඇ වැනි වගන්තිය)

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| බෝට්ටුවේ දිග මීටර්වලින් | ගාස්තුව (රු. මිලියන) |
| | අනන්‍ය ආර්ථික කලාපය තුළ |
| 15 ට අඩු | 5 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 20 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 80 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 130 |
| 75 ට වැඩි | 160 |
| පරිපාලන ගාස්තුව | මුල් ගාස්තුවෙන් 1/5 ක් |

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"හතරවැනි උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පස්වැනි උපලේඛනය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 23 වැනි පිටුවේ සඳහන් පස්වැනි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමට,—

**V වැනි උපලේඛනය**

(17 වැනි වගන්තිය)

| **I වැනි තීරය** | **II වැනි තීරය** |
|---|---|
| **බෝට්ටුවේ දිග මීටර්වලින්** | **දඩය (රු.)** |
| 15 ට අඩු | 100,000 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 200,000 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 500,000 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 1,500,000 |
| 75 ට වැඩි | 7,500,000 |

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"පස්වැනි උපලේඛනය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය"යි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**6. කල් තැබීම ("පාලම් දහස වැඩසටහන" යටතේ උතුරු පළාතේ ඉදි කරන ලද පාලම්) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 4.52 ට, අද දින සභා සම්මතිය අනුව, 2018 පෙබරවාරි මස 19 වැනි සඳුදා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.